# කොටි බෝම්බයට ඇමති ජෙයරාජ් බිලිවේ

**ම**හා මාර්ග සංවර්ධන ඇමති සහ ආණ්ඩු පක්ෂ ප්‍රධාන සංවිධායක ජෙයරාජ් ප්‍රනාන්දු පුල්ලේ මහතා වැලිවේරියේ ශාන්ති ක්‍රීඩාංගනය අසල දී මරාගෙන මැරෙන කොටිත්‍රස්ත වාදියෙකු විසින් පුපුරවන ලද බෝම්බයකින් මේ සතියේ 6 වෙනි ඉරිදා උදෑසන ජීවිතක්ෂයට පත්වී ය.

ප්‍රනාන්දුපුල්ලේ මහතාගේ අවසන් කටයුතු රාජ්‍ය ගෞරව සහිතව අද මීගමුව කොච්චිකඩේ වැලිහේන ක්‍රීඩාගනයේදී සිදුකිරීමට නියමිත ය.

මෙම පිපුරුමෙන් ඇමති වරයා ඇතුළු 15 දෙනෙකු එතැනම මිය ගොස් තිබුණි. ගම්පහ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවරයා ඇතුළු 83 දෙනෙකු තුවාල ලබා රෝහල් ගතකර ඇත. මියගිය අය අතර ඇමති වරයාට ආරක්ෂාව සැපයූ **STF** පොලිස් බලකායේ හටයන් 5 දෙනෙක්ද ශ්‍රී ලංකාවේ බිහිවූ දක්ෂතම මැරතන් ධාවන ශූරයෙකු වන කේ. ඒ. කරුණාරත්න මහතා සහ මලල ක්‍රීඩා ජාතික උපදේශක ලක්ෂමන් අල්විස් මහතාද වෙති. මැරතන් තරඟයට සහභාගි වූ තවත් ක්‍රීඩකයින් කීප දෙනෙකු ද මිය ගිය බව පැවසේ.

සිංහළ අළුත් අවුරුදු සමය නිමිති කරගෙන වැලිවේරියේ අධිෂ්ඨාන ක්‍රීඩා සමාජය සංවිධානය කළ සිරිලක් අභස්ගව්ව විවෘත මැරතන් තරඟය ආරම්භ කිරීමට නියමිතව තිබුණේ උදේ 7.00 ය. ඇමති වරයා එතැනට පැමිණ ඇත්තේ උදේ 6.10 පමණය. ඒ වන විටත් තරඟයේ සංවිධායකයන් පැමිණ නොසිටි නිසා එතුමා කඳුබොඩ ශ්‍රී විවේකාරාම විහාරස්ථානය වෙත ගියේය. එහිදී එහි විහාරාධිපති ධම්මරතන හිමියන් බැහැ දැක උදේ ආහාරයද එම විහාරස්ථානයෙහිදීම අනුභවකර ඇත. පසුව ඇමතිවරයා හේනෙගම පිහිටි **ජෙයරාජ් ප්‍රනාන්දු පුල්ලේ** අසපුව වෙත ගොස් එහි කටයුතු ද සොයා බලා තිබේ. එම අසපුව ඇමතිවරයා විසින්ම ඉදිකර සඟසතු කළ එකකි.

පසුව එතුමෝ වැලිවේරිය ක්‍රීඩාංගනය වෙත නැවත පැමිණියහ. ඒ වන විට උදෑසන 7.30 පමණ වී ඇත. එවෙලේ මැරතන් තරඟය ආරම්භ කිරීමට සියළු කටයුතු සූදානමින් තිබිණ. ක්‍රීඩකයෝ 250කට වැඩි පිරිසක් සිටියහ. ප්‍රදේශවාසීහු තුන්සීයකට අධික පිරිසක්ද වූහ.

මැරතන් තරඟය පටන් ගැන්මට පෙර විනාඩි 10 ක පමණ කතාවක් කළ ප්‍රනාන්දු පුල්ලේ මහතා මැරතන් ශූර කරුණාරත්න සමග ද සුහද වචන කීපයක් කතා කළේය. ඉන් පසු ඇමතිවරයා ඉදිරියට ගොස් ක්‍රීඩකයන්ට තරඟය අරඹන සංඥාව දෙමින් කොඩිය ඔසවා වැනීය ඒ සමගම මහා පිපිරීම් ශබ්දයක් ද සමග රැස්ව සිටි අය ඒමේ අත විසිවී ගියේය.

ප්‍රනාන්දුපුල්ලේ මහතාගේ සිරුර ඒ බෝම්බය පිපුරුණු ස්ථානයේ සිට අඩි 20 ක් පමණ ඈතට විසිවී ගොස් පාරේ වැටී තිබුණි. තවත් 15 දෙනෙකු ද එතැනැම මියගොස් සිටියහ. ඇමතිවරයා ගේ බෙල්ලෙන් පහල අත් පා සහිත



ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ මහතා

සිරුර මුළුමනින් විනාශවී තිබුණු අතර හිස හා මුහුණට හානියක් සිදු වී නොතිබිණ

1953 ජනවාරි මස 11 වෙනි දින උපත ලත් ප්‍රනාන්දු පුල්ලේ මහතා මිය යනවිට 55 වියේ පසුවිය. මීගමුව මාරිස් ටෙලා විදුහලෙන් අධ්‍යාපනය ලැබූ ඒ මහතා නීතිඥවරයෙකු වීය. විවාහ වී සිටියේ වෛද්‍ය වරියක වන සුදර්ශනී සමග ය. ඔවුන්ට දරුවන් දෙදෙනෙකි.

ශ්‍රීලංකා නිදහස් පක්ෂයේ භාණ්ඩාගාරික වූ ජෙයරාජ් ප්‍රනාන්දු පුල්ලේ මහතාගේ ජීවිතයට කොටි ත්‍රස්තවාදීන්ගෙන් නොයෙක් ආකාරයේ තර්ජණ එල්ල වී තිබුණු අතර ඒ මහතා පිළිබඳව ඔත්තු බැලීමට පැමිණි කොටි ත්‍රස්ත වාදීන් දෙදෙනෙකු මීට ඉහත ඒ නිවස ආසන්නයේ දී අත් අඩංගුවට ගෙන තිබුණි.

බෝම්බය පුපුරවා ගත් මරාගෙන මැරෙන කොටි ත්‍රස්ත වාදියාගේ යයි දැන් හඳුනාගෙන ඇති සිරුරද ඒ ආසන්නයේම වැටී තිබුණි. ඔහු එතැනට පැමිණ ජනයා අතර ගැවසී ඇත්තේ මුස්ලිම් ජාතිකයෙකු ලෙසට ඇඳගෙනය. ඔහු ළඟ තිබී සොයාගත් හැඳිනුම් පතේ ද වෙල්ල තම්බි මොහමදු අමීන් යනුවෙන් වූ නමුත් එය එසේ සකස් කරගත් ව්‍යාජ හැඳිනුම් පතක් බව දැන් එළිවී ඇත.

***ඇන්ටන් ප්‍රසාද් ජයමහ***
**කුරණ - මීගමුව**
**Sri Lanka**





**Photos - තිස්ස මඩවල**

# Army Chief in Buddha Gaya

**Tissa Madawela in Buddhagaya**

More than 30 members from the Elite Indian special Commando unit, the National Security Guard (NSG), popularly referred to as the Black Cats, were guarding the Sri Lankan army chief Lieutenant General Sarath Fonseka, when he took time off from his busy official visit to India, to visit Buddha Gaya the place where Lord Buddha attained enlightenment.

Ten minutes before his arrival at the site the whole temple complex was cleared of pilgrims as well as visitors and workers by the Indian security personnel for safety reasons. The visit lasted only 30 minutes so hundreds of Sri Lankan pilgrims were not unhappy by the heavy security blanket that rang the visiting military chief but pleased about the care and protection taken by the authorities. Mr. Fonseka and his party were welcomed by the Head of Mahabodhi Vihara in Buddha Gaya and was taken to the main shrine room. He offered a large basket of flowers to the Buddha Statue and took five precepts. Resident monks at the temple chanted Seth Pirith and Mr. Fonseka offered Atapirikara and a special robe which was immediately put on the Golden Buddha statue.He was then taken to the site where the Bodhi Tree is situated.

After the visit General Fonseka ignored the advice of his security personnel and came over to talk to hundreds of Sri Lankan pilgrims who were waiting to enter the temple. Many went closer to talk to him and in some instances knelt down before him in a moving gesture of affection and respect.

# හමුදාපතිවරයා බුද්ධගයාවේ

**මේ** නොබෝදා ඉන්දියාවේ නිල සංචාරයක යෙදුණු ශ්‍රීලංකා හමුදාපති ලුතිනන් ජෙනරල් සරත් පොන්සේකා මහතා ඒ ගමනේදී දඹදිව බුද්ධගයාව වැඳ පුදා ගැන්මට ද ගියේය. ඒ මහතා ට ආරක්ෂාව සපයමින් ඔහු හා ඉන්දිය විශේෂ කොමාන්ඩෝ බලකායේ ආරක්ෂක නිලධාරි ඒකකයේ පිරිසද ඔහු සමග පැමිණ සිටියෝය. හමුදාපති වරයා එහි ඇති රන්වන් බුද්ධ ප්‍රති මාවට අටපිරිකර පූජා කළ අතර, එහි අධිපති ස්වාමීන් වහන්සේ ඇතුළු සංඝයා වහන්සේලා සෙත් පිරිත් දේශ නාකර හමුදාපතිවරයාට සෙත් පැතූහ.

අනතුරුව හමුදා පතිවරයා තම ආරක්ෂ ක නිලධාරීන්ගේ උපදෙස් ද නොතකා විහාරයට එවෙලේ පැමිණ සිටි ශ්‍රී ලංකා වන්දනා පිරිස ඉදිරියට ගොස් ඔවුන් හා කතා කළේය. ඒ පිරිස ඉන් කොතරම් සතුටට පත්වුනාද යත් බොහෝ දෙනා පොන්සේකා මහතාට ගෞරව පිණිස ඔහුට දණගසා වඳිනවා ද පෙනුණි.




## පාඩම් ඉගෙනගනීද? අවුරුද් 25 ක් ගිහිං තවමත් නැත!

**දැ**න්නා කිසි කෙනෙක් නරකක් නොකියන හොඳ දේශපාලකයෙක්. හොඳ ඇමතිවරයෙක්. ඒ වගේම හිත උණුවෙන මිනිහෙක්. දවස් කීපයකට පෙර මැරුණු ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලෙ ඇමතිවරයාගේ මරණය ගැන අහලා ඔහු හොඳින් දන්නා කෙනෙක් කී කතාවක් ඒ. මම ජෙයරාජ් පුද්ගලිකව දන්නෙ නැහැ. නමුත් ඔහු ගැන නරකක් මට අහන්න ලැබිලා නැහැ. ඒ මරණෙන් පස්සෙ දැන් කියනවා ඇහෙනවා හරියට සිකියුරිටි දුන්නෙ නැත, ඒකය එහෙම වුණේ කියලා. හැම තිස්සෙම ඔය වගේ ත්‍රස්ත බෝම්බයක් පිපිරිලා කවුරුහරි ලොක්කෙක් ප්‍රභූවරයෙක් මැරුණම හැම සැරේකම ඔය කතාව අහන්න ලැබෙනවා. දැන් මේ ඇහුවෙ සිය වෙනි වතාවට වෙන්න ඇති. මේ කාරණය ගැන මම මීට ඉස්සෙල්ලත් ලියලා තියනවා. මේ හැම පාරකදිම මං අහන ප්‍රශ්නයක් තමයි ලංකාවෙ මිනිස්සු පාඩම් ඉගෙන ගන්නෙ කවදද කියන එක.

මම හොඳට තේරුම් ගත්ත දෙයක් තමයි ලෝකෙ වෙන කිසිකෙනෙක් නොගන්න විදියෙ පියවරවල් ලංකාවෙ අය ගන්නවා, අන්තරායක් ළඟ විය හැකි බව හොඳටම දැන දැන. ඒ මෝඩකම මං හිතන්නෙ ලාංකික ගතිය. ඒක අත්අරවන්න බැරි දෙයක්. හොඳට විමර්ෂණය කළොත් පේනවා, ලාංකිකයාගෙ මෝඩ උඩඟුකමක් තියනවා. කවුරු හරි කිව්වොත් පරිස්සම් වෙන්න කියලා, ඒ කීමට අභියෝගයක් හැටියට, අයියෝ ඔහොම බය වෙලා ජීවත් වෙන්නෙ පුළුවන්ද කියලා පපුව ඉස්සරහට දාලා ගිහිං ඉල්ලං කනවා. දැන් ජෙයරාජ්ගෙ කතාවට ආයි එමු.

ජෙයරාජ් ඇමතිවරයා දැනගන හිටියා තමා කොටින්ගෙ හිට් ලිස්ට් එක නැත්නම් ප්‍රහාරක ලැයිස්තුවෙ මුල හරියටම ඉන්න බව. මේ මෑතක එයාගෙ ගේ ළඟදි ඔත්තු බලපු කොටි දෙන්නෙකුත් ඇල්ලුවා. එයාගෙ කාර්යාලෙ සේවකයන්ගෙන් තොරතුරු කොටින්ට යන බවත් ඔහු හොඳින් දැනගෙන හිටියා. ඉන්න මීගමුවෙ, හලාවත, කොච්චිකඩේ ඔය තැන්වල දැන් මරාගෙන මැරෙන ඇයෙ ඇවිත් බුරුතු පිටින් ගෙවල් අරං පදිංචිවෙලා ඉන්න බවත් දන්නවා. ඔච්චර දන්නව නං ඇයි බොඩිගාඩ් ලා තුන්දෙනෙකුත් එක්ක, උදේ පාන්දර අවුරුදු උත්සව වලටයි, මැරතන් දුවවන තැන්වලටයි යන්නෙ? ඒ තුන් දෙනාට පුළුවන්ද මරාගෙන මැරෙන එකෙක් නවත්වන්න? එහෙම නැත්නම් බෝම්බයක් අටවලා තියලා දුර ඉඳන් රිමෝට් එකකින් පුපුරවන කොට නවත්තන්න? ලෝකෙ වෙන ඕනම රටක දේශපාලකයෙකුට ඔය විදියෙ මරණ තර්ජණ තියනවා නම් මෑන් ගෙයින් එළියට බහින්නෙ නෑ. අනික ජෙයරාජ් ඔය රේස් එකට ඕනමද? එයා නාව නම් ඔය එකෙකුටවත් දුවන්න බැරිද? අනික් කාරණේ ලංකාවෙ තියන ගොං දේශපාලනේ හැටියට මන්ත්‍රීතුමා අවුරුදු උත්සවේට ආවෙ නැත්නම්, දුවගෙ කොටහලු මගුල් ගෙදර ආවෙ නැත්නම්, මරණෙ ගෙදරට ආවෙ නැත්නම් ඡන්දෙ දෙන්නෙ නෑ. ඉස්සෙල්ලම හොයන්න ඕන කවුද ඔය වගේ තැන්වලට ඇමතිවරුන්ට ආරාධනා කරන්නෙ කියලා? උන් තමයි වැරදිකාරයො.

කොටි ත්‍රස්තවාදෙ හරියටම ක්‍රියාත්මක වෙන්න වෙලා මේ අවුරුද්දට අවුරුදු 25 ක් වෙනවා. මේ විසිපහ ඇතුළෙ කී දෙනෙක් කොටි බෝම්බ වලින් මැරුණද? රන්ජන් විජේරත්න, ලලිත් ඇතුළත්මුදලි, ජනාධිපති ප්‍රේමදාස, ගාමිණී දිසානායක, ඔසී අබේගුණසේකර, ලකී අල්ගම, මුතාලිබ්, ලක්ෂමන් කදිරගාමර්, පාරමී කුලතුංග, ලිස්ට් එක තව දිගයි. ඒ කිසි කෙනෙකුගෙ මරණයෙන් අනෙක් අය පාඩමක් ඉගෙනගෙන නැහැ. අවුරුදු 25 ක් ගිහිල්ලත් හැසිරීම අන්තිම මෝඩයි. කොටියො බුද්ධිමත් හන්ද නෙවෙයි. අපේ ලොකු ලොක්කන්ට මොළයක් නැති නිසයි කොටින්ගෙ උගුල් වලට අහුවෙන්නෙ.

ආතර් සී ක්ලාර්ක්ට පිංසිද්ද වෙන්න සැටලයිට් තාක්ෂණය නිසා අද පණිවුඩ හුවමාරුව දියුණු වෙලා. දැන් හැම කෙනෙක් අතේම මොබයිල් පෝන් එකක්. හැම කොටියෙක් ගාවම ඒක තියනවා. මරන්න අවශ්‍ය පුද්ගලයගෙ ඉරියව් ඔත්තුකාරයො දුන්නම ඝාතකයා සූදානම් වෙලා තිතට වැඩේ කරනවා. එච්චර විතරක් නෙවෙයි මොබයිල් පෝන් එකේ සිග්නල් විමර්ශණය කරලා හොයා ගන්න පුළුවන් පුද්ගලයා ඉන්න ගෙදරත්. ඒ නිසා අද රහසක් කියලා දෙයක් නැහැ. හැංගෙන්න පුළුවන් තැන් අඩුයි. තමිල් චෙල්වම් පරලොව ගියෙත් ඒ තාක්ෂණය අනුව තමයි.

සැටලයිට් කතා පැත්තකට දාමු. දෙකේ පන්තියේ කුමාරෝදෙ පොතේ තිබුණ කතාවක් මේ. දඩයක්කාරයා හැමදාම එකම වෙලාවට එකම පාරකින් යනවා වළහා බලාගෙන, නෝට් කරගෙන ඉඳලා, ගහක් උඩට නැගලා දඩයක්කාරයගෙ ඇඟට පැන්නා. දඩයක්කාරයට නෝ චාන්ස්. වළහට ඒක තේරුණා නම් ත්‍රස්තවාදී කොටියට කෙහොමට තේරෙනවා ඇද්ද? රන්ජන් විජේරත්න ඇමති හැමදාම එකම පාරෙන් ගියේ. ඒක කොටි දැනගෙන හිටියා. මැරුණු බුද්ධි අංශයෙ ලොක්කොත් එහෙමයි. කදිරගාමර් විදේශ ඇමතිවරයා හැන්දෑවට බුලර්ස් පාරේ ගෙදර පූල් එකට ඇවිත් නාන බව කොටි දැනගෙන හිටියා. පොලිස්පති ඒ ගැන අවවාද කරලා තිබුණත් ඇමති ඒක ඇහුවෙ නෑ. ඇයි අපේ නායකයන්ට මොළේ නැත්තෙ? මං හිතන්නෙ නැහැ ඔය ගැන අපට තවත් කියන්න දේ ඉතුරුවෙලා තියෙනවයි කියලා.

**♦ වෙලේගෙදර රාළ London**